# මූලික පිරිවෙන් පළමුවාර පරීක්ෂණය - 2019

## 05 ශ්‍රේණිය / Grade 05

| | |
|---|---|
| ඉතිහාසය - I, II | කාලය : පැය තුනයි. |
| History - I, II | Time : 03Hours |

**ඉතිහාසය - I**

**උපදෙස්**

- **මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.**
- **එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා දී ඇති උපදෙස් අනුව පිළිතුර පත්‍රයෙහි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් හිමිවේ.**

**අංක 01 සිට අංක 15 තෙක් සෑම ප්‍රශ්නයකටම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාල අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.**

**01.** ඉතිහාසය යනු විෂය සමූහයක් අධ්‍යයනය කිරීම යනුවෙන් ප්‍රකාශ කළේ ,

**(1)** ඊ.එච් කාර් **(2)** ජී.එම්. ටැවිලියන්

**(3)** ජවහල්ලාර් නේරු **(4)** පොලිබියස්

**02.** ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රධාන මූලාශ්‍ර වර්ග දෙක වන්නේ,

**(1)** සාහිත්‍ය මූලාශ්‍ර, දේශීය මූලාශ්‍ර **(2)** සාහිත්‍ය මූලාශ්‍ර, විදේශීය මූලාශ්‍ර

**(3)** සාහිත්‍ය මූලාශ්‍ර, පුරාවිද්‍යා මූලාශ්‍ර **(4)** පුරාවිද්‍යා මූලාශ්‍ර, දේශීය මූලාශ්‍ර

**03.** දීපවංශයේ දක්නට ඇති පරිච්ඡේද සංඛතව වන්නේ,

**(1)** 21 **(2)** 22 **(3)** 23 **(4)** 24

**04.** මහාවංශයේ කතුවරයා වන්නේ,

**(1)** මහානාම හිමි **(2)** කාශ්‍යප හිමි **(3)** රාහුල හිමි **(4)** වනරතන හිමි

**05.** ගිරි ලිපි යනුවෙන් හඳුන්වනු ලැබුවේ කුමන ලිපිද?

**(1)** ගල් ලෙන්වල ලියා ඇති ලිපි **(2)** ගල් පුවරුවල ලියා ඇති ලිපි

**(3)** ගල් තලා මත ලියා ඇති ලිපි **(4)** ගල් කණුවල ලියා ඇති ලිපි

**06.** දස මහා යෝධයන් පිළිබඳ හැදෑරීමේ දී වැදගත්වන සෙල්ලිපි වන්නේ,

**(1)** මිහින්තලා පුවරු ලිපිය, කළුදිය පොකුණ ලිපිය

**(2)** අඹගමුව ලිපිය, වෙලයික්කාර ලිපිය

**(3)** දෙවනගල ලිපිය, වේවැල්කැටිය ලිපිය

**(4)** සිතුල්පව්ව ලිපිය, සංඛපාල ලිපිය

**07.** අකලහස, මදෙහස, පිටදඩහස ලෙස වී වගාකල කන්න තුනක් පිළිබඳව සඳහන්වන සෙල්ලිපිය වන්නේ,

**(1)** තෝණිගල සෙල්ලිපිය **(2)** අඹගමුව සෙල්ලිපිය

**(3)** හබැස්ස ලිපිය **(4)** ගල්පොත ලිපිය

**08.** VOC කාසි අයත් වෙළඳ සමාගම කුමක්ද?

**(1)** පෘතුගිසි වෙළඳ සමාගම **(2)** ලන්දේසී වෙළඳ සමාගම

**(3)** ඉංග්‍රිසි වෙළඳ සමාගම **(4)** ප්‍රංශ වෙළඳ සමාගම

**09.** අපගේ සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කරන ජීවමාන ශාක්ෂිය වන්නේ,

**(1)** සෙල්ලිපි, කාසි, නටඹුන් **(2)** දාගැබ්, මූර්ථී, කැටයම්

**(3)** චිත්‍ර , මූර්ථී, කැටයම් **(4)** සෙල්ලිපි, කැටයම්, නටඹුන්

**10.** දකුණු ආසියාවේ ඇති විශාලතම දූපත වන්නේ,

**(1)** ඉන්දියාව **(2)** ශ්‍රි ලංකාව

**(3)** මාල දිවයින **(4)** ඉන්දුනීසියාව

**11.** ශ්‍රි ලංකාව ඉන්දියාවෙන් වෙන් වන්නේ කොපමණ දුරකින්ද?

**(1)** කි.මී 30 **(2)** කි.මී 31 **(3)** කි.මී 32 **(4)** කි.මී 33

**12.** ශ්‍රි ලංකාවේ පිහිටා ඇති වරායක් වන්නේ,

**(1)** මන්නාරම **(2)** කුරුණෑගල

**(3)** එලිෆන්ට්පාස් **(4)** යාපනය

**13.** අනුරාධපුරය පිහිටා ඇති ගංගා නිම්නය කුමක්ද?

**(1)** මල්වතු ඔය **(2)** කලා ඔය **(3)** දැඳුරු ඔය **(4)** කිරිඳි ඔය

**14.** සිව් මහා ගංගාවලට අයත් වන්නේ,

**(1)** වළවේ, කිරිඳි, කළු,මහවැළි **(2)** මහවැළි, කැළණි, කළු, වළවේ

**(3)** මහවැළි, දැඳුරු, කළු,වළවේ **(4)** මහවැළි, ගිං, කිරිඳි, වළවේ

**15.** අතීතයේ දොළොස් දහස් රට යනුවෙන් හැඳින් වූ පාලන ප්‍රදේශයේ සීමා වන්නේ,

**(1)** වළවේ ගඟ හා මහවැළි ගඟ **(2)** වළවේ ගඟ හා බෙන්තර ගඟ

**(3)** වළවේ ගඟ හා ගිං ගඟ **(4)** වළවේ ගඟ හා කළු ගඟ

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලෙපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.**

**16.** **(1)** සීගිරිය **(2)** දඹුල්ල **(3)** හපුතලේ **(4)** යාපහුව

**17.** **(1)** බෝධි ඝර **(2)** දාගැබ් **(3)** ආරාම **(4)** රාජසභා

**18.** **(1)** මුවදෙව්දාවත **(2)** සසදාවත **(3)** දළදා සිරිත **(4)** අමාවතුර

**19.** **(1)** අනුරාධගාම **(2)** දීඝගාම **(3)** උරුවේලගාම **(4)** උපතිස්ස ගාම

**20.** **(1)** පණ්ඩු **(2)** පාරින්ද **(3)** තිරිතර **(4)** පනයමාර

- **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන යුගල හතර බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් නාම/ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම/ප්‍රකාශන යුගලය තෝරන්න.**

**21.** **(1)** විජය - තම්මැන්නාව **(2)** අනුරාධ - අනුරාධගාම
**(3)** උපතිස්ස - උපතිස්ස ගාම **(4)** උරුවෙල් - ගෝණ ගාම

**22.** **(1)** පණ්ඩුකාභය - අභය වැව **(2)** දේවානම්පියතිස්ස - තිසා වැව
**(3)** වසභ - හුරුළු වැව **(4)** මහසෙන් - මින්නේරිය වැව

**23.** **(1)** මහා විජයබාහු - අඹගමුව සෙල් ලිපිය
**(2)** මහා පරාක්‍රමබාහු - දෙවනගල සෙල් ලිපිය
**(3)** නිශ්ශංකමල්ල - ගල්පොත ශිලා ලේඛනය
**(4)** වසභ - වේවැල්කැටිය

**24.** **(1)** ලෙන් ලිපි - මිහින්තලා ලිපිය **(2)** ගිරි ලිපි - රජගල ලිපිය
**(3)** පුවරු ලිපි - ගල්පොත ලිපිය **(4)** ටැම් ලිපි - රිටිගල ලිපිය

**25.** **(1)** ඩී මුන්ඩෝ - ඇරිස්ටෝටල් **(2)** නැචුරාලිස් හිස්ටෝරියා - ප්‍රොකෝපියස්
**(3)** ඉන්ඩිකා - මෙගස්තිනීස් **(4)** භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය - ටොලමි

**අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා (A), (B), (C), (D) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා,**

(A) සහ (B) පමණක් නිවැරදි නම් - 1 ද
(B) සහ (C) පමණක් නිවැරදි නම් - 2 ද
(C) සහ (D) පමණක් නිවැරදි නම් - 3 ද
(A) සහ (D) පමණක් නිවැරදි නම් - 4 ද සලකුණු කරන්න.

**26.** ශ්‍රී ලංකාවේ භූ ගෝලීය පිහිටීම සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේද?

A – ඉන්දියානු අර්ධද්වීපයට දකුණින් පිහිටා ඇත.

B – ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වන්නේ කිලෝමීටර් 34 ක පමණ පටු මුහුදු තීරයකිනි.

C – ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 65620 පමණ වේ.

D - ශ්‍රී ලංකාවේ දිග දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා කිලෝමීටර් 447 කි.

**(1)** A සහ B **(2)** B සහ C **(3)** C සහ D **(4)** A සහ D

**27.** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික හා පූර්ව ඓතිහාසික යුග සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ මොනවාද?

A – පූර්ව ඓතිහාසික යුගය යනු ප්‍රාග් ඓතිහාසික යුගයට පසු පැවති යුගයයි.

B – ඉබ්බන්කටුව සුසාන භූමියෙන් ශිලා සුසාන හෙවත් ගල් පෙට්ටි සුසාන හමු වී තිබේ.

C – පොතාන හා අස්මඩල ප්‍රාග් ඓතිහාසික මානවයන් වාසයකල වෙරළාශ්‍රිත ප්‍රදේශ වේ.

D – කෘෂිකර්මාන්තය මෙකළ ප්‍රධාන ජීවනෝපාය විය.

**(1)** A සහ B **(2)** B සහ C **(3)** C සහ D **(4)** A සහ D

**28.** අනුරාධපුර රාජධානිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A – අනුරාධපුර රාජධානියේ ආරම්භක පාලකයා විජය රජුය.

B – හිතකර දේශගුණය අනුරාධ ග්‍රාමය රාජධානියක් කිරීමට හේතු විය.

C – භූමියේ පිහිටීම වාරි තාක්ෂණය දියුණු වීමට හේතු විය.

D – කළා ඔය නිම්නයේ අනුරාධපුරය පිහිටා ඇත.

**(1)** A සහ B **(2)** B සහ C **(3)** C සහ D **(4)** A සහ D

**29.** I විජයබාහු රජු සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ

A – මෙතුමා ප්‍රථමයෙන් මළය දේශයේ පාලකයා බවට පත් විය.

B – I විජයබාහු රජතුමා වසර 14 ක් වනගතව සැඟවී සිටියහ.

C – මෙතුමා කුඩාකල කිත්ති නමින් හැඳින්විය.

D – බුද්ධරාජ නම් සෙනෙවියෙකු මෙතුමාට කුඩාකල ආරක්ෂාව සැපයිය.

**(1)** A සහ B **(2)** B සහ C **(3)** C සහ D **(4)** A සහ D

**30.** කෝට්ටේ රාජධානිය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේද?

A – ශ්‍රී ලංකාවේ පස්වන රාජධානිය වේ.

B – VII පරාක්‍රමබාහු කෝට්ටේ ආරම්භක පාලකයාය.

C – VI පරාක්‍රමබාහු රජු සුනේත්‍රා දේවි පිරිවෙන ඉදිකළේය.

D – තොටගමුවේ රාහුල හිමි මෙකළ සිටි ප්‍රකට පඬිවරයෙකි.

**(1)** A සහ B **(2)** B සහ C **(3)** C සහ D **(4)** A සහ D

**අංක 31 සිට 35 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ ඇති නාම/ප්‍රකාශන X තීරුවේ ඇති නාම/ප්‍රකාශන සමග කිසි යම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනු පිළිවෙලට නොවේ. ඒවා ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට නිවැරදි පිළිතුර තෝරන්න.**

**31.**

| | X | Y |
|---|---|---|
| (1) | IV පරාක්‍රමබාහු | A - දඹදෙණිය |
| (2) | VII භුවනෙකබාහු | B - යාපහුව |
| (3) | I භුවනෙකබාහු | C – කුරුණෑගල |
| (4) | III විජයබාහු | D - ගම්පොල |

**(1)** B A D C **(2)** D B A C **(3)** A B D C **(4)** C D B A

**32.**

| | X | Y |
|---|---|---|
| (1) | ජුපිටර් | A මව් දෙවඟන |
| (2) | වීනස් | B – අහසට අධිපති දෙවියා |
| (3) | නෙප්චූන් | C – මුහුදට අධිපති දෙවායා |
| (4) | කිබලේ | D – ආලයට අධිපති දෙවඟන |

**(1)** B D C A **(2)** D A B C **(3)** A B D C **(4)** C A B D

**33.**

| | X | Y |
|---|---|---|
| (1) | මගධ | A -කොසඹෑ |
| (2) | කෝසල | B - උදේනිය |
| (3) | වත්ස | C – රජගහනුවර |
| (4) | අවන්ති | D – ශ්‍රාවස්ථි |

**(1)** C B A D **(2)** A D B C **(3)** B A D C **(4)** C D AB

**34.**

| | X | Y |
|---|---|---|
| (1) | ශාක්‍යයන් | A - කුසිනාරා |
| (2) | මල්ලයන් | B - කපිලවස්තු |
| (3) | ලිච්ඡවීන් | C – මිථිලා |
| (4) | විදේහයන් | D – වේසාලි |

**(1)** D A B C **(2)** A D C B **(3)** B A D C **(4)** C D A B

**35.** X Y

| | X | Y |
|---|---|---|
| (1) | කෝට්ටේ | A - වික්‍රමබාහු |
| (2) | රයිගම | B - VII භුවනෙකබාහු |
| (3) | සීතාවක | C - මායාදුන්නේ |
| (4) | උඩරට | D - මද්දුමබංඩාර |

**(1)** D A B C **(2)** B D C A **(3)** A B C D **(4)** C A B D

**ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැලපෙනුයේ පහත වගුවෙහි දක්වෙන 1, 2, 3, 4 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ගෙන අදාළ අංකය පිළිතුරු පත්‍රයෙහි සලකුණු කරන්න.**

| **වරණ අංකය** | **පළමු ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | **පිළිතුර** |
|---|---|---|---|
| **36.** | I විජයබාහු රජුගේ පාලන මධ්‍යස්ථානය වුයේ පොළොන්නරුව යි. | I විජයබාහු රජු පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රධාන මූලාශ්‍රය වල්ලිපුරම් රන් සන්නස වේ. | ------- |
| **37.** | I පරාක්‍රමබාහු රජු නිකාය බේදය තුරන් කරන ලදි. | ආලාහන පිරිවෙන් සංකීර්ණය ඉදිකිරීම I පරාක්‍රමබාහු රජු ගේ ආගමික සේවයකි. | ------- |
| **38.** | ලංකා ඉතිහාසය හැදෑරීමේ ප්‍රධාන මූලාශ්‍රය දීපවංශය යි. | දීපවංශය රචනා වුයේ ක්‍රි.ව 6 වන සියවසේ ය. | ------- |
| **39.** | විජයගේ අගනුවර වුයේ පුත්තලමට උතුරින් පිහිටි අනුරාධගාමය යි. | පණ්ඩුවාසදේව ගේ බිසව වුයේ භද්දකච්චායනා කුමරිය යි. | ------- |
| **40.** | කලා ඔය නිම්නයේ උරුවෙල ගාම පිහිටා තිබුණි. | මල්වතු ඔය නිම්නයේ විජිතගාම පිහිටා තිබුණි. | 2<br>------- |

***

# මූලික පිරිවෙන් පළමුවාර පරීක්ෂණය - 2019

## 03 ශ්‍රේණිය / Grade 03

| | |
|---|---|
| ඉතිහාසය | - I, II |
| History | - I, II |

### ඉතිහාසය - II

**උපදෙස්**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 60 ක් හිමිවේ.**

**01. (i)** ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන** ලකුණු කර නම් කරන්න.

**1.** කලා ඔය **2.** අනුරාධපුරය **3.** ජම්බුකොල පට්ටන

**4.** පාහියන්ගල **5.** මහියංගනය **6.** මහාගාම **(ලකුණු** 1 × 6 = 6)

**(ii)** පහත දී ඇති රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



**A** රූපය

**(අ) A** වලින් දැක්වෙන රූපය කුමක්ද?

**(ආ)** මෙය පිහිටි ඓතිහාසික නගරය කුමක්ද?

**(ඉ)** මෙය කරවන ලද්දේ කව්රුන් විසින් දැයි සඳහන් කරන්න.

**(ලකුණු** 1 × 3 = 3)



**B** රූපය

**(අ)** රූපයේ දැක්වෙන සොහොන් වර්ගය කුමක්ද?

**(ආ)** මෙය හමු වී ඇති සුසාන භූමිය කුමක්ද?

**(ඉ)** මෙම සොහොන් තුල තැම්පත් කොට ඇත්තේ මොනවාද ?

**(ලකුණු** 1 × 3 = 3)

" අනුරාධපුර යුගයේ අවසානය දක්වා මෙරට ඉතිහාසය හැදෑරීමේ දී වංශකථා ප්‍රමුඛස්ථානයක් ගනී "

**02. (i)** මෙරට රචනා වූ ප්‍රථම වංශ කථාව හා ප්‍රධානම වංශ කථාව නම් කරන්න.

**(ii)** ඉහත **(i)** ට අදාලව ඔබ විසින් නම් කල ප්‍රධාන වංශ කථාව රචනා කිරීමට යොදාගත් ඊට පෙර රචනා වූ ග්‍රන්ථ 4 ක් නම් කරන්න.

**(iii)** ඉතිහාසය හැදෑරීමට වංශකථාවල වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**03. (i)** ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට උපකාරීවන පුරාවිද්‍යා මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

**(ii)** පුරාවිද්‍යා මූලාශ්‍ර මගින් ලබාගත හැකි ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

**(iii)** වර්ථමානයේ පුරාවස්තු විනාශවන ආකාර දෙකක් සඳහන්කර අප පුරාවස්තු ආරක්ෂාකර ගත යුත්තේ ඇයි දැයි පෙන්වා දෙන්න. **(ලකුණු** 2 + 4 + 6 = 12

" ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩ ගැසීම කෙරෙහි මෙරට භූගෝලීය පිහිටීම බෙහෙවින් බලපා ඇත."

**04.** **(i)** ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීමේ ප්‍රධාන ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

**(ii)** ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ඇති වූ බලපෑම් **හතරක්** නම් කරන්න.

**(iii)** ශ්‍රී ලංකාව ප්‍රධාන මුහුදු මාර්ගයේ සන්ධිස්ථානයක පිහිටීම නිසා ඇති වූ බලපෑම කරුණු දෙකක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**05.** **(i)** ශ්‍රී ලංකාව වටා පිහිටා ඇති ප්‍රධාන වරායන් **දෙකක්** නම් කරන්න.

**(ii)** ලංකාවට වැසි ලැබෙන ප්‍රධාන **ක්‍රම දෙක** නම් කර එලෙස ලැබෙන වර්ෂා ජලය ගොවිතැන් කටයුතු වලට යොදාගත් **ක්‍රම දෙක** නම් කරන්න.

**(iii)** මෙරට ඛනිජ සම්පත් හා ජෛව විවිධත්වය ඉතිහාසයට බලපෑ ආකාරය කරුණු දෙකක් යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**06.** **(i)** මෙරට පූර්ව ඓතිහාසික යුගයට අයත් ස්ථාන දෙකක් නම් කරන්න.

**(ii)** මෙරට පූර්ව ඓතිහාසික යුගයට අයත් වෙරළාශ්‍රිත **ප්‍රදේශ දෙකක්** හා කඳුකර තෙත් කළාප **දෙකක් නම්** කරන්න.

**(iii)** අනුරාධපුර රාජධානිය බිහිවීමට බලපෑ **සාධක දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු** 2 + 4 + 6 = 12)

**07.** පොළොන්නරු රාජධානිය ඇසුරින් පහත මාතෘකා විස්තර කරන්න.

**(i)** පළමුවන පරාක්‍රමබාහු රජුගේ ආගමික කටයුතු

**(ii)** පොළොන්නරු රාජධානියේ පරිහානියට හේතු

**(ලකුණු** 6 x 2 = 12)

**08.** පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික තොරතුරු දක්වන්න.

**(i)** අශෝක අධිරාජ්‍යයාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය

**(ii)** පළවන විජයබාහු රජතුමා

**(iii)** ලන්දේසී යුගයේ ආර්ථික බලපෑම

**(iv)** කෝට්ටේ යුගයේ සාහිත්‍ය

**(ලකුණු** 6 x 2 = 12)

***